## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය - 2016

---

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 09 දරන පනතින් සංශෝධිත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

----------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.144,214,218 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් වසර 10 කට පෙර බදු ගන්නා ලද ඉඩමක් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් 2016 අප්‍රේල් 28 දින දීමනා පත්‍රයක් ලබාදී තිබුණු අතර එම ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.156,000,000 කින් සියයට 10 ක් පමණක් මුදලින් ගෙවා තිබුණි. ඉතිරිය වූ රු.140,400,000 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඉඩමේ වටිනාකම රු.15,600,000 ක් ලෙස පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) තවද ඉහත (අ) හි සඳහන් ඉඩම වෙනුවෙන් පසුගිය වසර 10 ක් තුල ගෙවන ලද මුළු බදු කුලියවූ රු.10,920,000 ක් ගෙවිය යුතු මුදලින් අඩුකර ඉතිරි මුදල පමණක් මුදලින් ගෙවීම්කර තිබුණි. එම නිසා ඉකුත් වර්ෂ 10 තුලදී ලාභයෙන් අඩුකල රු.10,920,000 ක් නැවත රඳවාගත් ලාභයට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

### 2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

( අ) ව්‍යාපෘති ගිවිසුම් නිමවී වසර 4 ක කාලයක් ඉකුත්ව තිබූ පර්යේෂණ ව්‍යාපෘති 3 කින් ආයතනය වෙත ලැබිය යුතු රු.1,903,969 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ශේෂ සනාථන මගින් එම ශේෂය තහවුරු කරගෙනද නොතිබුණි.

( ආ) 2014 වර්ෂයේ සිට රාජ්‍ය අමාත්‍යාංශයකින් ලැබිය යුතුව තිබුණු රු.1,147,747 ක මුදලක් අයකර ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රමාණය බොල් ණය ප්‍රතිපාදන ලෙස දක්වා තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 12(1) වගන්තිය අනුව ආයතනයේ ආධාරය සහ සහාය ඇතිව භාරගනු ලැබිය යුතු ප්‍රතිපත්ති අධ්‍යයන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් උපදෙස්දීම පිණිස පර්යේෂණ උපදේශක කමිටුව පත්කර නොතිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.13,802,781 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,119,500 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,683,281 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පොලී ආදායම රු.12,246,692 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තයක් පැවති අතර එය වාර්ෂිකව උච්ඡාවචනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.70,650,200 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.91,151,651 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 05 වන වගන්තිය අනුව ආයතනයේ කර්තව්‍යයන් කෙටියෙන් පහත දැක්වේ.

- ජාතික සංවර්ධන සැලසුම්වලට සහ ප්‍රතිපත්තිවලට අදාළව අධ්‍යයන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පවත්වා ගෙනයාම.
- සංවර්ධන අධ්‍යයනවලට සම්බන්ධ ආණ්ඩුවේ ආයතන, විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමග සම්බන්ධතා ඇතිකර ගැනීම.
- සමාජ ආර්ථික පර්යේෂණ භාර ගැනීම හා සමාජ ආර්ථික පර්යේෂණ පවත්වාගෙන යාම
- විදේශීය පර්යේෂණ ආයතන හා ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සමග එක්වී අධ්‍යයන, සම්මන්ත්‍රණ හෝ සාකච්ඡා පවත්වාගෙන යාම.
- ආර්ථික හා සමාජ පර්යේෂණ තොරතුරු සහ වෙනත් අදාළ කරුණු රැස්කර තැබීම සඳහා ගබඩාවක් පිහිටුවීම.

ඉහත කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය හා විදේශීය ආයතන වෙතින් කරන ලද ඉල්ලීම් මත ආයතනය විසින් සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය යටතේ කෘෂිකාර්මික සංවර්ධනය, කම්කරු , දිළිඳුකම, ජාත්‍යන්තර සේවා, පාරිසරික ආර්ථික ප්‍රතිපත්ති සහ සෞඛ්‍ය හා ආර්ථික ප්‍රතිපත්ති වශයෙන් ක්ෂේත්‍රයන් 06 ක් ඇතුළත්වන පරිදි සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘති 41 ක් ආරම්භ කර තිබුණි. මෙම පර්යේෂණ ව්‍යාපෘති 41 ක තුළ පසුගිය වර්ෂයේදී අවසන් කිරීමට නොහැකිවූ පර්යේෂණ 09 ක්ද ඇතුළත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් 2015 වර්ෂයට අදාලව ක්‍රියාත්මක කළ නමුත් එම වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකිවූ පර්යේෂණ ව්‍යාපෘති 09 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් කර තිබුණද ඉන් ඉපයීමට අපේක්ෂා කළ ආදායම රු.10,222,109 ක් වුවත් උපයා තිබුණේ රු.7,726,358 ක ආදායමක් පමණි. තවද ඉකුත් වර්ෂයේදී ආරම්භ කරන ලද නමුත් සමාලෝචිත වර්ෂයේදී අවසන් කිරීමට නියමිත තිබූ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂයේදී අවසන් කර නොතිබුණි. මින් අපේක්ෂිත ආදායම රු.2,296,571 ක් විය.

(ii) 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ පර්යේෂණ ව්‍යාපෘති ආදායම සියයට 51 කින් වැඩිවී තිබුණද 2014 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය වන විට එය සියයට 59 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත පර්යේෂණ ව්‍යාපෘති ආදායම රු.40,000,000 ක් වුවද, කාර්යසාධන වාර්තාවට අනුව උපයා ගෙන තිබුණේ රු.25,027,771 ක ආදායමක් හෙවත් සියයට 62.5 ක් පමණි. කෙසේ වුවද ආයතනය විසින් අපේක්ෂිත පරිදි පර්යේෂණ නොකිරීම මේ සඳහා හේතුවී ඇති අතර මෙම තත්ත්වය අවම කර ගැනීමට ක්‍රියාමාර්ගයන් ගෙන තිබේද යන්න නිරීක්ෂණය නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති කාර්යසාධන වාර්තාවේ භෞතික හා මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ආයතනයේ කාර්යසාධනයේ ප්‍රගතිය ඇගයිය නොහැකි විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශනයට පත්කළ පොත් වර්ග 11 ක් වෙනුවෙන් පොත් 3350 ක් මුද්‍රණය කිරීම සඳහා රු.1,220,326 ක වියදමක් දරා තිබුණි. ඒ අතුරින් පොත් 853 ක් අලෙවියෙන් රු.728,525 ක ආදායමක් ලබා තිබූ අතර පොත් 1387 ක් ප්‍රභූන් වෙත ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද අවශ්‍යතාවය නිසි පරිදි ඇස්තමේන්තු කිරීමකින් තොරව මුද්‍රණය කිරීම නිසා ප්‍රකාශන පොත් වලින් සියයට 33 ක්, එනම් පොත් 1110 ක් අලෙවි කිරීමට හෝ බෙදා දීමට නොහැකිව ඉතිරිව තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

භෞතිකව නොපවතින වටිනාකම රු.8,200,412 ක්වූ ස්ථාවර වත්කම් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතියකින් තොරව පොත්වලින් ලියා හැර තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**-----------------------------------------**

**5.1 සංයුක්ත සැලැස්ම**

**------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

**--------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු.1,493,963 ක්වූ කාර්යාල උපකරණ සහ ගොඩනැගිලි ඉදිකිරීම් ඇතුළත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම්හි ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ආ) ක්‍රියාකාරී සැලැස්ම | ක්‍රියාකාරී සැලැස්ම කාලීනව ඇගයීමට ලක් නොකිරීම. |
| (ඇ) ලැබියයුතු ණය | දිගුකාලීන ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |